# සීගිරි ලන්දූ යක්ෂණියෝ ද?

කාශ්‍යප රජු මව් පාර්ශ්වයෙන් යක්ෂ ගෝත්‍රයට අයත්වීමත් ඒ හේතුව නිසා ම හෝ වෙනත් කරුණක් නිසා හෝ ථෙරවාදී බෞද්ධයකු නොවීමත් නිසා මහාවිහාරික භික්ෂුන්වහන්සේ කාශ්‍යප රජුට විරුද්ධ වන්නට ඇත. අනෙක් අතට කාශ්‍යප රජු පීතෘඝාතක වී නම් ඒ හේතුවෙන් මහාවිහාරික භික්ෂුන්වහන්සේ රජුට විරුද්ධ වීම නිසා වෙනත් දහමක් අනුගමනය කරන්නට ඇත. ඒ කුමක් වුවත් ප්‍රතිඵලය වූයේ කාශ්‍යප රජු ථෙරවාදී බෞද්ධයකු නොවීම යැයි අපට සිතාගත හැකි ය. එසේ ම පළමුව සිදුවූයේ කුමක් වුව ද දිනෙන් දින මහාවිහාරික භික්ෂුන්වහන්සේ හා කාශ්‍යප රජු අතර විරසකය වැඩිවන්නට ඇත. පසුකලෙක සීතාවක රාජසිංහ රජු හා භික්ෂුන්වහන්සේ අතර ද එවැනි විරසකයක් ඇති වූ බව නිසැක ය. එහෙත් කාශ්‍යප රජුට රාජසිංහ රජුට මෙන් නොව ජනතාවගේ යම් පක්ෂපාතීත්වයක් තිබූ බව පෙනෙයි.

කාශ්‍යප රජු ඇදහූ ආගම කුමක් දැයි අපට නිශ්චිතව කිසිවක් කිවහැකි නො වේ. ඔහු භික්ෂුන්වහන්සේගේ සිත දිනාගැනීමට වෙහෙර විහාර පූජාකර ඇති නමුත් ඔහුගේ ආගම යක්ෂ ගෝත්‍රිකයන් යම් පිරිසක් ඇදහූ ජෛන ආගම යැයි අනුමාන කළ හැකි ය. ඔහුගේ යක්ෂ සම්භවය අපට ඒ අනුමානකිරීමට හේතුවක් වෙයි. අප කලින් ද සඳහන් කර ඇති පරිදි යක්ෂ භෝත්‍රිකයෝ යම් පිරිසක් ජෛන ආගමිකයෝ වූහ. යක්ෂ ගෝත්‍රිකයන් අනෙක් ගෝත්‍රියන්ට වඩා දඹදිව නම් සාමාන්‍යයෙන් සෞභාග්‍යයෙන් ආඪ්‍ය වූ බව පෙනී යයි. ජෛන ආගම ඇදහූවෝ ද සාමාන්‍යයෙන් ධනවත් වූහ. යක්ෂ නායක නායිකාවෝ ජෛන මුනිවරුන්ගේ ආරක්ෂකයෝ වූහ. සාමාන්‍යයෙන් මහාවීර ඇතුළු ජෛන මුනිවරුන් විසිඅටදෙනාගේ පිළිමවල එක් පසෙක යක්ෂයකුගේ ද අනෙක් පස යක්ෂණියකගේ ද පිළිම නෙළා ඇත. ඒ යක්ෂ යක්ෂණියන් ඒ ඒ මුනිවරයාගේ ආරක්ෂකයන් වූ නිසා ය.

යක්ෂ ගෝත්‍රිකයන් ගැන ඇති එක් මතයකට අනුව යක්ෂයෝ කුවේරගේ සේවකයෝ වූහ. කුවේර ද යක්ෂ දෙවියකු වූ බව නිසැක ය. ඔහු මරණින් පසු දේවත්වයට ඔසවන ලද යක්ෂ ගෝත්‍රික නායකයකු හෝ මරණින් පසු දෙවියකු වූ යක්ෂ නායකයකු වන්නට ඇත. එපමණක් නොව ඔහු දේවත්වයට එසවීමට පෙර ඉතා ධනවත් යක්ෂ ගෝත්‍රික නායකයකු වන්නට ඇත. කෙසේ වෙතත් කුවේර ධනවත් බවේ දෙවියන් ලෙස සැලකෙයි. අදත් ඉතා ධනවත් අය ධන කුවේරයන් ලෙස හැඳින්වෙති. පසු කලෙක දඹදිවට ආර්යයන් පැමිණි විට වෛදික ආගම් විසින් එහි සිටි දෙවියන් යම් ධුරාවලියක ලා සකස් කෙරී ඇති බව පෙනී යයි.

යක්ෂ ගෝත්‍රිකයකු ලෙස කුවේරට ද පර්සියාව හා එහි සංස්කෘතිය සමග යම් සම්බන්ධකමක් තිබෙන්නට ඇත. ඔහු දඹදිව ජීවත්වන්නට ඇත්තේ ද යම් පමණකට හෝ ඒ සංස්කෘතියෙහි ය. කුවේරගේ ආලකමන්දාව පිළිබඳ වෛදික මතවාද බිහිවන්නට ඇත්තේ ඔහුගේ දඹදිව ජීවිතය ආශ්‍රය කරමින් විය හැකි ය. කාශ්‍යප රජුට ද මේ මතවාද මෙන් ම සංස්කෘතිය ද බලපාන්නට ඇතැයි අපට සිතාගත හැකි ය. මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා සීගිරි කාශ්‍යප රජු කුවේර මෙන් සීගිරි ගල මුදුනේ ජීවත් වී ඇතැයි කියා ඇත්තේ හුදු සිතිවිල්ලක් ලෙස විය නො හැකි ය.

මේ සම්බන්ධයෙන් තවමත් බොහෝ දෙනාගේ සැලකිල්ලට යොමු නොවූ කරුණක් සඳහන් කළ යුතු ය. මෝගල් හෙවත් මුගල් අධිරාජ්‍යයේ ඉහළ ම නිර්මාණයක් ලෙස සැලකෙන ටාජ්මහල් මන්දිරය දහහත්වැනි සියවසේ නිමැවිණි. සභාජාන් රජු ක්‍රිස්තුවර්ෂ 1631 දී තම තුන්වැනි බිරිය මියයෑම නිසා ශෝකයට පත්ව බිසව වෙනුවෙන් ඒ මන්දිරය ඉදිකර ඇත. එහි ගෘහ නිර්මාණ ශිල්පය පර්සියන්, අරාබි ඉන්දියන් සංකලනයක් යැයි කියැවෙයි. ඒ අතර එහි උද්‍යානයෙහි ඇති සෘජුකෝණාසාකාර රටාව හා එය චාර්බාග් හෙවත් චතුර්උද්‍යාන ලෙස හැඳින්වෙන කුඩා උයන් හතරකටත් බෙදාතිබීම සැලකිල්ලට ගත යුතු ය. මේ චාර්බාග් සංකල්පය ක්‍රිස්තු පූර්ව 558-330 සමයෙහි වූ පැරණි පර්සියන් අධිරාජ්‍යක් දක්වා දිව යයි.

සීගිරියෙහි උයන් සංකල්පය ද එයට කෙතරම් සමාන ද යන්න විමසා බැලිය යුතු ය. කාශ්‍යප රජතුමාට යක්ෂ සම්බන්ධකම් ඔස්සේ මේ පර්සියන් උයන් සංකල්පය ලැබිණි ද? ටාජ්මහල් හා සීගිරිය අතර යම් සම්බන්ධයක් තිබේ ද? සීගිරිය කුවේර මෙන් ජීවත්වීමට උත්සාහගත් යක්ෂ සම්බන්ධකම් ඇති රජකුගේ නිර්මාණයක් නම් පර්සියන් උද්‍යාන

© Prof. Nalin De Silva

සංකල්පයක් සීගිරියට එකතුවීම පුදුමයට කරුණක් නොවිය යුතු ය. එහෙත් මේ සම්බන්ධයෙන් වැඩිදුර අධ්‍යයනයක් අවශ්‍ය බව අමුතුවෙන් කිවයුතු නො වෙයි. සීගිරියේ කරන ලද කැණීම්වලින් මෑතක දී මතුකරගත් උයන් රටාව මනා අධ්‍යයනයකට යොමු කළ යුතු වෙයි.

සීගිරි චිත්‍රවලින් පිළිබිඹුවන්නේ කවුරුන් ද යන ප්‍රශ්නය ඒ සමග වෙයි. ඒ අප්සරාවන් යැයි ඇතැම්හු කියති. තවත් සමහරුන්ට අනුව එහි ඇඳ ඇත්තේ කාශ්‍යප රජතුමාගේ දියණියන් ය. සීගිරිය මහායාන පන්සලක් ලෙස සිතන්නන්ට සීගිරි චිත්‍රවල ඇත්තේ භාවනාවට යොමුකර ගත හැකි රූප ය. සීගිරිය කාශ්‍යප රජුගේ යක්ෂ සංස්කෘතිය නිරූපණය කරන තැනක් නම් සීගිරි චිත්‍රවලින් දැක්වෙන්නේ යක්ෂණියන් විය හැකි ය. මෙහි යක්ෂණියන් යැයි හැඳින්වෙන්නේ යක්ෂ දෙවඟනන් ය. යක්ෂයෝ මෙන් ම යක්ෂණියෝ ද ඉහත සඳහන් කර ඇති පරිදි කුවේරට සේවය කළ දෙවියෝ වෙති.

යක්ෂයන් හා යක්ෂණියන් ලෙස පැරණි දඹදිව හඳුන්වන්නට ඇත්තේ දේවයත්වයට ඔසවනු ලැබූ යක්ෂ ගෝත්‍රිකයන් විය හැකි ය. එසේත් නැතහොත් දේවාත්ම ලැබූ යක්ෂ ගෝත්‍රිකයන් විය හැකි ය. නැත්නම් ඒ දෙකොටසම වන්නට ඇත. ඔවුහු කුවේරට සේවය කළහ. ඇතැම් යක්ෂයෝ හා යක්ෂණියෝ ජෛන මුනිවරුන්ට ආරක්ෂාව සැලසූහ. ඔවුහු දිව්‍ය ගණයට අයත්වූහ. මේ යක්ෂයන් හා යක්ෂණියන් පහත් තත්වයකට ඇද දමනු ලබන්නට ඇත්තේ වෛදිකයන් විසින් විය යුතු ය. ආර්යයන් දඹදිවට පැමිණීමෙන් පසුව ගොඩනඟන ලද වෛදික සංස්කෘතියෙහි යක්ෂ ගෝත්‍රිකයන් මෙන් ම ඔවුන්ගේ දෙවිවරුන් වඩ යක්ෂයන් හා යක්ෂණියන් පහතට දැද දමනු ලැබ ඇති බව පැහැදිලි ය.

එහෙත් දඹදිව මෙන් ම ලංකාවේ ද යක්ෂ ගෝත්‍රිකයන් අතර (පසු කලෙක ලංකාවේ නම් සිංහල ජාතියට මුළුමනින් ම ඇතුල් නොවූ යක්ෂ ගෝත්‍රිකයන් අතර) යක්ෂයන් හා යක්ෂණියන් දිගින් දිගට ම දේවත්වයෙන් සලකනු ලබන්නට ඇත. කාශ්‍යප රජු ද තම යක්ෂ ගෝත්‍රික සම්බන්ධකම් හේතුවෙන් යක්ෂයන් හා යක්ෂණියන් දේව ගණයෙහි ලා සලකන්නට ඇත. සීගිරිය යක්ෂ සංස්කෘතියෙහි නිර්මාණය කරන ලද්දක් නම් සීගිරි චිත්‍රවලින් පිළිබිඹුවන්නේ යක්ෂණියන්, එනම් යක්ෂ දෙවඟනන් විය හැකි ය.

යක්ෂණියන් නිරූපණය කෙරෙන්නේ රූමත්, ඉන්ද්‍රිය පිනවන, පුළුලුකුල් සහිත, සිහින් ඉඟක් ඇති, පුළුල් දෙවුරැති, වටකුරු පියවුරු සහිත තැනැත්තියන් ලෙස බව පොතපතෙහි සඳහන් වෙයි. මේ විස්තරය සීගිරි චිත්‍ර සමග ද මනාව ගැලපෙයි. සීගිරි ළඳුන් යක්ෂණියන් වීමට ඉතා විශාල සම්භාවිතාවක් ඇත. සීගිරි කුරුටු ගීවල එවැනි ඉඟියක් පමණවත් ඇත්දැයි සොයා බැලිය යුතු ය. එහෙත් සීගිරි ගී ලිවුවනට ද සමස්ත සීගිරිය ම අබිරහසක් වන්නට ඇත්තේ ඒ ගී ලියා ඇත්තේ චිත්‍ර ඇඳීමෙන් සියවස් දෙක තුනකටවත් පසුව නිසා ය. ඒ වන විට යක්ෂ සංස්කෘතිය ගැන පැතිරි දැනුමක් නොතිබිණි නම් සීගිරිය යක්ෂ සංස්කෘතියෙහි ප්‍රතිඵලයක් ලෙස දැකීමට උත්සාහ කළවුන් විරල වන්නට ඇත.

සීගිරි ළඳුන් යක්ෂණියන් නම් පරණවිතාන මහතා කාශ්‍යප රජු කුවේර මෙන් ජීවත්වීය යනුවෙන් පළකර ඇති මතයට තවත් එළියක් වැටෙයි. යක්ෂණියෝ කුවේරට සේවය කළ තැනැත්තියෝ වූහ. කාශ්‍යප රජුට සේවය කිරීමට යක්ෂණියන් නොවූ බැවින් ඔහු යක්ෂණියන්ගේ රූප සිතුවම් කළා විය හැකි ය. එසේත් නැතහොත් කුවේර සිහි කරමින් යක්ෂණියන්ගේ රූප සිතුවම් කළා විය හැකි ය. යක්ෂයන්ගේ රූප සිතුවම් කිරීමට කාශ්‍යප රජුට අනවශ්‍ය වන්නට ඇත.

වර්තමානයේ ජීවත්වන අපට සීගිරිය අබිරහසක් වන්නේත් අනන්‍ය වන්නේත් අද අපට වැව් හා ගොවිතැන හැරෙන්නට එය යක්ෂ සංස්කෘතියෙන් ඉතිරි වී ඇති අනන්‍ය අංගයක් වීම නිසා විය හැකි ය. එවැනි නිර්මාණ තවත් නැති බැවින් අපට එහි අරුමයක් දැනෙයි. යක්ෂ සංස්කෘතියට සම්බන්ධකම් කිවහැකි අනෙක් රජු වූ මහසෙන් රජු අපට වැව් ඉතිරි කර ඇත. වැව් යක්ෂ සංස්කෘතියෙන් ලබාගත්ත ද ඒ සිංහල සංස්කෘතියෙහි ප්‍රධාන අංගයක් බවට පත්වී ඇති බැවින් ඉන් අපට අමුත්තක් නො දැනෙයි.

එහෙත් සීගිරිය එසේ නො වේ. එය ඇත්තේ සිංහල සංස්කෘතියෙන් බැහැරව ය. අපි අද යක්ෂණියන් දෙවඟනන් ලෙස නො සලකමු. අද අපට යක්ෂණියක් කී විට මැවී පෙනෙන්නේ විරූපී දත් නෙරාගොස් මුවින් එළියට පැමිණි දිව එළියට දමාගත් තැනැත්තියකි. විශේෂයෙන් ම පසු කලෙක කේරළ සංස්කෘතිකාංග මිශ්‍ර වීමෙන් පසුව ඒ අදහස අප අතර

© Prof. Nalin De Silva

තවත් තහවුරු වී ඇත. කේරළයේ යක්ෂණියෝ විරූපි තැනැත්තියෝ වෙති. එහෙත් යක්ෂණියන් යනු දෙවඟනන් ලෙස සිතන්නට පටන්ගත් පසු අපට සීගිරි චිත්‍ර පෙනෙන්නේ වෙනත් ආකාරයකට ය.

එහෙත් අපට තවත් වැදගත් ප්‍රශ්නයක් ඉතිරි වී ඇත. සීගිරිය එසේ හැඳින්වෙන්නේ ඇයි? ඒ සිංහ ගිරිය තේරුම ගෙන දෙයි. සීගිරියේ ඇති සිංහ කට එයට හේතුව වන්නට ඇත. සීගිරි ගලේ උඩ ඇති කාශ්‍යප නිවසට (එයට එකල මාළිගාව යැයි නොකියන්නට ඇත. මාළිගාව යන්න නුවර යුගයේ එකතු වූ වචනයකි. අනුරාධපුරයේ ඇත්තේ දළදා ගෙයක් මිස දළදා මාළිගාවක් නො වේ. අද ද අපි බුදු ගෙ, විහාර ගෙ හා රජ ගෙ යන වචන යොදා ගනිමු.) ඇතුල් විය හැක්කේ සිංහ කටින් ය.

සීගිරියේ සිංහයා කාගේ නිර්මාණයක් ද? එය කාශ්‍යප රජුගේ ම නිර්මාණයක් ද? එසේත් නැතහොත් එය පසුව රජවූ සිංහ (මෞර්ය) වාංශික රජකු විසින් නිර්මාණය කරන ලද්දක් ද? සීගිරිය සිංහල සංස්කෘතියේ අංගයක් බවට පත්කිරීමට හෝ එයටත් එහා ගොස් සීගිරියෙහි සිංහ ආධිපත්‍යය පිහිටුවීම සඳහා හෝ වෙනත් රජකු පසුව සිංහයා ඉදිකරන්නට ඇත. එසේත් නැතහොත් කාශ්‍යප රජු යක්ෂ සම්බන්ධකම් ඇති තමා ජීවත් වන්නේ සිංහ කටක් තුළ බව මතක්කර ගැනීමට හෝ සිංහයන්ට අභියෝගාත්මක ව හෝ සිංහයා නිර්මාණය කරන්නට ඇත. ඒ කුමක් වුවත් සීගිරිය යක්ෂ සංස්කෘතියේ බිහිවූවක් නම් එය සිංහ ගිරිය නමින් සීගිරිය ලෙස හැඳින්වීම ද එක්තරා ආකාරයක ඓතිහාසික සරදමක් වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva